**පාණදුර නගර සභාව**

**2025 වර්ෂය සඳහා කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම**

පාණදුර නගර සභාව විසින් 2025 වසර සඳහා ඉදි කිරීම් (වැඩ) කටයුතු සඳහා ලියාපදිංචි වීමට කැමැත්ත දක්වන සුදුසුකම් ලත් කොන්ත්‍රාත්කරුවන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. අදාල අයදුම්පත්‍රය රාජකාරී දිනයන්හි පෙ.ව.9.00 සිට ප.ව.3.00 දක්වා පාණදුර නගර සභා කාර්යාලයෙන් ලබා ගෙන නිසි පරිදි සම්පූර්ණ කර අදාල ලිපි ලේඛන හා ලියාපදිංචි ගාස්තු සමග **2025.07.31 දින ප.ව.3.00**ට පෙර අතින් හෝ ලියාපදිංචි තැපැලෙන් 'ලේකම්,පාණදුර නගර සභාව 'යන ලිපිනයට එවිය යුතුය.

| අනු අංකය | CIDA ලියාපදිංචි ශ්‍රේණිය | ලියාපදිංචි ක්ෂේත්‍රය | ලියාපදිංචි ගාස්තුව |
|---|---|---|---|
| 01 | C9 හෝ ඉහළ | a.ගොඩනැගිලි<br>b.මහා මාර්ග<br>c.පාලම් | රු.2000.00 |
| 02 | EM5 හෝ ඉහළ | විදුලි හා යාන්ත්‍රික සේවා | |

**කොන්දේසි**

- තෝරාගනු ලබන කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවනු ලබන අතර,අවස්ථානුකූලව කොන්ත්‍රාත්කරුවන් විසින් නිසි ආකාරව ව්‍යාපෘතිවලට අදාළ වැඩ ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවලදී හා යම් විශේෂිත අවස්ථාවන්හිදී ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් බැහැරව සේවය (වැඩ) ලබා ගැනීමේ අයිතිය සභාව සතු වේ.
- ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීමේ කොන්දේසි වලට අනුකූලව ක්‍රියා කරනු නොලබන අවස්ථාවන්හිදී ඔවුන්ගේ නම් කිසිදු දැන්වීමකින් තොරව ලේඛනයෙන් ඉවත් කරනු ලැබේ.
- මීට පෙර වර්ෂ වල සේවා(වැඩ) සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමට අපොහොසත් වූ හෝ ලැයිස්තුවෙන් නම් කපා ඉවත් කළාවූ කොන්ත්‍රාත්කරුවන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කරනු ලැබේ.යම් ව්‍යාපෘතියක වැඩ කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වැඩිමනත් කොන්දේසි පැනවීම අවශ්‍ය යැයි පෙනී ගියහොත් එසේ කිරීමේ අයිතිය සභාව සතු වේ.
- සියලුම කර්මාන්ත සඳහා කොන්ත්‍රාත්කරරුවන් වශයෙන් ලියාපදිංචි වීමට කැමති කොන්ත්‍රාත්කරුවන් විසින් "CIDA" ආයතනයේ මාර්ග,ගොඩනැගිලි ,පාලම් හා වෙනත් විෂයන්ට අදාළව ලියාපදිංචි අංකය හා පොත ඉදිරිපත් කල යුතුයි.
- අවස්ථානුකූලව ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් බාහිරව කොන්ත්‍රාත් කටයුතු සිදු කිරීමේ අයිතිය සභාව සතු වේ.
- අදාළ ව්‍යාපෘයෙහි ගෙවීම් වාර්තා ලබා දීමෙන් පසුව ගෙවීම කටයුතු සිදු කරනු ලබයි.
- කොන්ත්‍රාත් කරුවන් විසින් සිදු කරනු ලබන වැඩ සඳහා වැට් සහිත/රහිත බව අනිවාර්යෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. (වැට් ලියාපදිංචි සහතිකය අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.)
- 2025.07.31 දිනට පසු අතින් හෝ ලියාපදිංචි තැපැලෙන් ලැබෙන අයදුම්පත් පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2025.07.11 දින,**

**ලේකම්,**
**පාණදුර නගර සභාව.**
**038-2232275**